සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

71 | S | I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - දෙවන වාර පරීක්ෂණය - 2019 මාර්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை - இரண்டாம் தவணைப் பரீட்சை - 2019 மார்ச்
General Certificate of Education (Adv. Level) - Second Term Test - March 2019

13 ශ්‍රේණිය
Grade 13

සිංහල - I
Sinhala - I

පැය තුනයි
Three hours

**සැලකිය යුතුයි :**

- **පළමු** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

- පහත දැක්වෙන උද්ධෘත අතුරෙන් **හතරක්** තෝරාගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (මෙම ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

(01) අ) මෙසේ අමාත්‍යයාගේ මෙහෙවර ගිය තැනැත්තී කී ස්වරූපය අසා වෙළෙඳාණන්ගේ භාර්යාවෝ ස්වභාවයෙන් ම තමන් තුනුරුවන් කෙරෙහි මමත්වය ඇති ව ශ්‍රද්ධාවන්ත හෙයිනුත් පළමු තමන් ශ්‍රමණ බ්‍රාහ්මණයන් අතින් බණ ඇසූ හෙයිනුත් ''මේ කුණු ශරීරයෙන් තොපගේ අමාත්‍යයාණන්ට ප්‍රයෝජන කිම් ද? එම්බා මේ ශරීරය නම් මුක්තකින් මැණිකකින් රනකින් රත්රනකින් නිමියේ නොවෙයි. **උත්පල පදුම පුණ්ඩරිකාදීන්** මෙන් අභ්‍යන්තරයෙහි සුවිපවිත්‍ර තැනෙක උපන්නෙත් නොවෙයි. මවුකුස නමැති කුණපයෙහි පණුවකු මෙන් උපන්නේ ය. එසේ උපන්නා වූ සරාගී පුරුෂ නමැති කුණපය තෙමේ තමාට වඩනා මාතුගාම නමැති කුණපයෙහි ම ඇලුම් කරන්නේ ය. ඉන්ද්‍රජාලයෙහි පෙනී ගිය රූපයක් බඳු වූ අස්ථිර වූ මේ රූපය අඥාන ජනයෝ ස්ථිරසාර දෙයෙකැ යි ප්‍රාර්ථනා කෙරෙති. මෙසේ මේ ශරීරය නම් කෙස් ලොම් ආදී දෙතිස් කුණප කොටසින් යුක්ත හෙයින් ඇතුළෙහි කසළ පුරා පිටත සිතියම් කළ ප්‍රතිමා රූපයක් හා සමාන ය. එසේ පිළිකුල් වූ ශරීරය අඥාන ජනයන්ට සන්තෝෂ එළවන්නේ ය.

i. ඡේදයට අනුව වෙළෙඳාණන්ගේ භාර්යාව අවබෝධ කරගෙන සිටි දහම් කරුණු මොනවා ද?
ii. ශරීරයේ ආරම්භය හා එහි ස්වභාවය කෙබඳු ද?
iii. ''මේ ශරීරය නම් මුක්තකින් මැණිකකින් රනකින් රත්රනකින් නිමියේ නොවෙයි.'' මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.
iv. ''උත්පල පදුම පුණ්ඩරිකාදීන්'' යන යෙදුමට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04)

ආ) සිටුදුවණියෝ සිතන්නෝ 'මුගේ කටයුත්තක් ඉතා නපුරු නියා ය. නුවණ නම් ඇති වන්නා පලාගෙන කන්ට නොවත් ප්‍රයෝජන නිසා වුව. ආදි කුමක් සිතා කුමක් කෙළෙම් නමුත් තටත් කළමනා දෙය දැන් තරයෙක කෙරෙමි' සිතාලා 'ස්වාමීනි, එදවස් මරන්ට ගෙන යන නියාව දැක දෙමාපියන්ට කීමි. උෟ මසු දහසක් යවාලා මැරිය නොදී ගෙන්වා ගෙන මට නිල කළෝ ය. මම එවක් පටන් පක්ෂපාතව ම විසීමි. දැන් මරතී කියා **මුසුප්පු** වන්ට පිළිවන් ද? බල එකෙක් නම් මිය යන ගමනේ මා සිතක් මතක් සේ වැඳගත දුන මැනවැ'යි කිවූ ය. 'යහපත සොඳුර, වඳුව' යි කියා කවර තරමෙක වඳිනා වැඳීමක් බවත් නො දැන අවසර දී ලා ගල් කෙළවර සිටියේ ය. සිටු දුවණියෝත් තුන් විටක් පැදකුණු කොටලා සතර තැනෙක සිට වැඳලා 'ස්වාමීනි, මේ කෙළවර දැක්ම ය. මෙවක් පටන් මුඹ වහන්සේගේ මා දැක්මකුත් මාගේ මුඹ වහන්සේ දැක්මකුත් නැතැ'යි කියාලා ඉදිරි දිසාවේ සිටත් සිපගෙන පියා පිටිපස්සේ සිටත් සිපගෙන පියා

කුමක් දෝ හෝ යි සිතමින් ගල් කෙළවර පමා ව සිටියහු තුමූ පිටිපස්වලා එක් අතෙකින් බොටුව අල්වාගෙන එක් අතකින් පිටි මුල අල්වාගෙන උෟගේ කායබල තරමට තමන්ගේ ඥානාකෘති වූ මායා බලය මහත් හෙයින් ගල්මුදුනෙන් දැමූහ. හෙතෙම කඩ කඩ ව ගලින් හී මිය තෙමේ ම බිලි විය.

i. ස්ත්‍රියට හා පුරුෂයාට ස්වභාවයෙන් උරුම වී ඇති බලයන් මොනවාද?
ii. සිටු දියණිය සමණන්ට නමස්කාර කළේ කෙසේ ද?
iii. ''නුවණ නම් ඇති වන්නා පලාගෙන කන්ට නොවත් ප්‍රයෝජන නිසා වුව.'' මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.
iv. ''මුසුප්පු'' යන වචනයට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04)

ඇ) තව ද එම රජගහ නුවර අසූ කෙළක් ධන ඇති සිටාණ කෙණෙකුන්ට ද ශීර්ෂාබාධයක් ඇති ව ඉස්මුල් සැත් ලාලා ලියා හරණා සේ මහත් වූ වේදනා ඉපැද මරණප්‍රාප්ත වූහ. ආචාරිවරයෝ දෙදෙනෙක් අවුත් සිටාණන් බලා නිදන් දැක ව්‍යාධිය අසාධ්‍ය නියාවත් සිටාණන් නොරැකෙන නියාවත් දැක එක් කෙණෙක් ''සිටාණෝ පස් දවසෙකින් මියෙති, පිළියමින් කම් නැතැ''යි කියා ගියහ. එක් කෙණෙක් ''සත් දවසෙකින් මියෙති. මේ ලොවට පිළියම් නො කරවා පරලොවට ප්‍රතිකාරයක් කොට ගන්ව.'' යි කියා ගියහ. එ පවත් බිම්බිසාර රජ්ජුරුවෝ අසා ඉතා මහත් වූ කම්පා ඇති ව ''මාගේ නුවර නැගු ධ්වජයක් සේ ඉතා මහත් වූ ප්‍රසිද්ධ වූ සිටාණෝ මළාහු නම් මට මහත් වූ හානි වන්නේ ය.'' යි සිතා ජීවකයන් කැඳවා ''පුත ජීවකයෙනි, මාගේ අසවල් සිටාණන් රැක දීලව''යි කියා ජීවකයන් යවූහ.

එකල ජීවකයෝ ගොස් සිටාණන්ගේ අවස්ථා දැක පෙර ආචාරීවරුන් දෙදෙනා කියා ගිය පවතුත් අසා තුමූ ද පරීක්ෂා කොට දිවසින් දුටුවා සේ දැක ''ඔවුන් කීයේ සැබව. නුඹ ඉස **මත්ථලුංගභෝජක** නම් පණුවෝ දෙදෙනෙක් අටගත්හ. එයින් එකෙක් මහත. එකෙක් කුඩා ය. මහත් පණු ඉස් මුල් පස් දවසෙකින් කා නිමයි. කුඩා පණු හත් දවසෙකින් කා නිමයි. ඔහු දෙදෙන ම තමන් තමන්ගේ ශාස්ත්‍රයෙන් පණුවන් දෙදෙනා වෙන වෙන ම දුටහ.

i. සිටාණන්ට දැනුණ වේදනාව කෙබඳු වී ද?
ii. වෛද්‍යවරු තිදෙනා ම රෝගය හඳුනා ගත්තේ කෙසේ ද?
iii. ''මගේ නුවර නැගු ධ්වජයක් සේ ඉතා මහත් වූ ප්‍රසිද්ධ වූ සිටාණෝ මළාහු නම් මට මහත් වූ හානි වන්නේ ය.'' මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.
iv. ''මත්ථලුංගභෝජක'' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04)

ඈ) ''ස්ත්‍රී ගඟ සමීපයේ බැද්දේ උන්නී ය. ශක්‍රයෝ මෙපවත් දැන **පඤ්චසිඛයා** හා මාතලී දිව්‍ය පුත්‍රයා කැඳවා කියන්නාහු අසවල් ගඟ සමීපයේ උන් ස්ත්‍රී වෙහෙසෙන්ට උව මැනැව''යි කියා පඤ්චසිඛයා උකුසු වෙසක් හා මාතලී දිව්‍ය පුත්‍රයා මත්ස්‍ය වෙසක් හා ශක්‍රයෝ තුමූ කැනහිල් වෙසක් මවාගෙන කටින් දඬමස් කැටියක් ඬැ ගෙන මම ගඟ සමීපයේ වෙරළ ගාවා යෙමි. පඤ්චසිඛය, තොපි උකුසු වේසයෙන් ආකාශයෙන් ඇවිදුහා. මාතලිය, තොප මත්ස්‍ය වේසයෙන් මා යන ඉදිරියට දියෙන් ගොඩ පැන පියව්, මම කට තුබු මාංශය දමා මත්ස්‍යයා ඬැ ගන්නට යෙමි. පඤ්චසිඛය, තෝ උකුසු වේසයෙන් මා දැමූ මාංශ කැටිය ඬැ ගනුව. මාතලිය, තෝ මත්ස්‍ය වේසයෙන් දියට පැන පියව.'' යි කියා තුන් දෙන අවුත් ඒ ස්ත්‍රිය සමීපයෙහි පෙනී ගියාහ. කැනහිල් මාංශ කැටියක් ඬැ ගෙන ගඟ සමීපයේ ගොඩ අසල යන කලට මත්ස්‍යයෙක් දියෙන් ගොඩට පැනපී ය. කැනහිල් කට තුබු මාංශ දමා මත්ස්‍යයා ඬැ ගන්ට දිවූ කල මත්ස්‍යයා දියට පැනපී ය. උකුසු මාංශ කැටිය ඬැ ගත. එ කියන සිගාලයා මත්ස්‍යයාත් නො ලැබ මාංශ කැටියත් නො ලැබ වික්ෂේප ගඟ සමීපයේ උන් ස්ත්‍රියගේ මූණ බලබලා සිටියේ ය. එවිට එකියන ස්ත්‍රී මහත් කොට සිනාසී පුවාහ.

i. ශක්‍රයා මාතලී දිව්‍ය පුත්‍රයාට පැවරූ කාර්යය කුමක් ද?
ii. ශක්‍ර වේසය ගත් සිගාලයාට මුහුණ පෑමට සිදු වූ සිද්ධිය කුමක් ද?
iii. ''එ කියන සිඟාලයා මත්ස්‍යයාත් නො ලැබ මාංශකැටියත් නො ලැබ වික්ෂේපව ගඟ සමීපයේ උන් ස්ත්‍රියගේ මූණ බල බලා සිටියේය.'' මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.
iv. ''පඤ්චශිඛයා'' යන්නට කෙටි විවරණ සපයන්න. (ල 04)

ඉ) සුදු පිරිසිදු වියනුත් උඩ බඳවා
මුදු ඉඳුවර මල් දම් එහි රඳවා
**විදු කිඳුයුරු** රන් රසු දැල් යොදවා
සැදු සුරසිඳු බඳු වට තිර අඳවා

සුවඳින් බිම පිරිබඩ ගෙන මොනවට
සදමින් සිහසුන මුතු සේසත් යට
තනමින් දෙපසෙහි දිළි රන් මිණි වැට
ඉසිමින් අසෙනිය මල් විසිතුරු කොට

i. වීණා වාද මණ්ඩපය සරසා ඇත්තේ කෙසේ ද?
ii. සිංහාසනයේ ගාම්භීරත්වය කෙබඳු වී ද?
iii. ''තනමින් දෙපසෙහි දිළි රන් මිණි වැට
ඉසිමින් අසෙනිය මල් විසිතුරු කොට''
මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.
iv. ''විදු සිඳුයුරු'' යන්නට කෙටි විවරණ සපයන්න. (ල 04)

ඊ) පහත උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය ලියන්න.
i. ''ස්වාමීනි, ආදි කෑ ඇඹුල පලින් ඉස ඔසවා ගත නො හෙමි.''
ii. ''මේ උන්නා වූ තොප ඇම දෙන අතුරෙන් පරදේශයට ගිය මිනිසුන් මරන්ට කවරෙක් සමර්ථ දැයි''
iii. ''එසේ හෙයින් හිර හා සඳ සම්භ වී නම් ඒ මාගේ රථය හොබ්බි. සෙසු සක්වලින් ප්‍රයෝජන නැතැ''
iv. ''දැන් ඉතින් උඹට කරදර කරන්ඩ කවුරුවත් මේකෙ නෑ. උඹට ආයෙ නිදහසේ ඉන්ඩ පුළුවනි.''
v. ''අපහට එන විපත්තියක් - ඔබ තුමාට සැලවූයේ ද?''
vi. ''අනේ මහත්තයා, මං වචන දෙකේ මිනිහෙක් නෙමේ. ඒ උනාට පවුලගෙං බේරෙන්ඩ බෑ.''
vii. ''අනික බෝධි පූජාවක් තියන්ඩ කියලා කවුරුත් කියනවා.''

උ) පහත දැක්වෙන කවි පෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න.

බලන විට අවට ලොව ඇර මතකයෙහි දෙයැස
පෙනෙයි නාගල කන්ද පැරණි මිතුරෙකු විලස

I

සුදු පතළ හිම අතර නුහුරු නුපුරුදු ලොවකි
කොළ හැළී ඇට සැකිලි ගස් පෙනේ එක දිගට
මට අරුම ලොවක් මැද නැගෙයි තනිකම රුදුරු
මගේ ගම, මගේ බස, නෑසියන් නොම පෙනේ

මට ම දොස් පවරමින් මෙරට පිවිසීම ගැන
සිත සිතා උපන් රට ගැන තිබඳ දුක් වෙමින
බලන විට අවට ලොව ඇර මතකයෙහි දෙයැස
පෙනෙයි නාගල කන්ද පැරණි මිතුරෙකු විලස

II

මහා සාගරය මැද කුඩා දිවයිනෙකි මෙය
ඇමරිකන් බලය මත දනන් නිති පොළඹවන
මැරුණු ගිනිකඳු අතර වියරු ගිනිකඳු තිබෙන
මට නොරිසි මෙදූවට පැමිණියේ කුමකට ද?

මට පුරුදු සිප් කලා, කවි සිනා නොම ඇසෙන
තනිකමේ වෙළී ගෙන හද පිරුණු දොම්නසින
බලන විට අවට ලොව ඇර මතකයෙහි දෙයැස
පෙනෙයි නාගල කන්ද පැරණි මිතුරෙකු විලස

III

සිරුර ගිනි ගත් විලස කලබලෙන් දුව පනින
කාසි මලු සොය සොයා දිවා රෑ වෙහෙස වෙන
දනන් පිරි මේ රටෙහි නිහඬ බව මරා ඇති
ජීවිතේ අරුත කිමදැයි අසමි මම මගෙන්

චීන බසමයි දිවා රෑ සවන වැකෙන්නේ
මේ රටේ පාළුවක් දැනෙයි ඉවසිය නොහැකි
බලන විට අවට ලොව ඇර මතකයෙහි දෙයැස
පෙනෙයි නාගල කන්ද පැරණි මිතුරෙකු විලස

එදා මෙන් අදත් තනි නොතනියට ඔබ පමණි
කාලයේ දේසයේ රහැන් බිඳ මවෙත එන (ලකුණු 12 යි)

(02) පුද්ගල සන්තානගත තෘෂ්ණාවේ ආදීනව ප්‍රකාශ කිරීමට සද්ධර්ම රත්නාවලී කතුවරයා සමත් වී ඇත්තේ කෙසේ දැයි නිර්දිෂ්ට කතා ඇසුරෙන් විමසන්න.

**නැතහොත්**

සර්වකාලීන මාතෘකාවක් වන පතිව්‍රතා ධර්මය බුදුන් වහන්සේගේ දේශනාවන්ට බඳුන් වූ ආකාරය නිර්දිෂ්ට ජාතක කතා ඇසුරෙන් අගය කරන්න. (ලකුණු 15 යි)

(03) ප්‍රේමය නිසා භය හා ශෝකය ඇති වන බව ප්‍රකාශ කරමින් සමාජයට සර්වකාලීන සදුපදේශයක් දීමට සද්ධර්මාලංකාර කතුවරයා ගත් උත්සාහය කොතෙක් දුරට සාර්ථක වී ඇත්දැයි නිර්දිෂ්ට කථා ආශ්‍රයෙන් විමර්ශනය කරන්න.

**නැතහොත්**

කතුවරයාගේ අරමුණු සාක්ෂාත් වන පරිදි චරිත නිරූපණයටත්, භාෂාව හැසිරවීමටත් පූජාවලී කතුවරයා සතු කුසලතාව නිර්දිෂ්ට කතා වස්තු ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15 යි)

(04) අ) සිංහල පද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස කෝට්ටේ සාහිත්‍ය යුගය සැලකීමට හේතු වූ කරුණු පැහැදිලි කරන්න. (ලකුණු 07 යි)

ආ) ප්‍රබල අවස්ථා හා සිද්ධි නිරූපණය කිරීමට වෑත්තෑවේ හිමියන් පෑ සමත්කම ගුත්තිල කාව්‍යයේ නිර්දිෂ්ට කොටස ඇසුරින් විමසන්න. (ලකුණු 08 යි)

(05) පාලක සමාජ බලවේග හමුවේ පාලිත සමාජයට අත්වන ඉරණම කලාත්මක ව ඉදිරිපත් කිරීමට බැද්දේගම කතුවරයා සමත් වී ඇත. විමසන්න. (ලකුණු 15 යි)

(06) නූතන සමාජ ආර්ථික ගැටලු කලාත්මක ව විවරණය කිරීමට නූතන කෙටිකතාකරුවා දක්වන සාමර්ථ්‍යය නියමිත කෙටිකතා **තුනක්** ඇසුරෙන් විමසන්න. (ලකුණු 15 යි)

(07) සමාජ යථාර්ථය විවරණය කිරීමෙහි ලා කවීන් විවිධ ආකෘති අනුගමනය කර ඇති ආකාරය උචිත උදාහරණ **තුනක්** ඇසුරෙන් විමර්ශනය කරන්න. (ලකුණු 15 යි)

(08) නාට්‍යෝචිත අවස්ථා මගින් අමරණීය වූ ප්‍රේමය පුද්ගලයා මෙහෙයවන ප්‍රබල බලවේගයක් බව ප්‍රකාශ කිරීම ට නාට්‍යකරුවා සමත් වී ඇත. පේමතෝ ජායතී සෝකො නාට්‍යයෙන් නිදසුන් දක්වමින් මෙම ප්‍රකාශය සනාථ කරන්න. (ලකුණු 15 යි)